**තේ පර්යේෂණ මණ්ඩලය - 2020**
-----------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**
-----------------------

**1.1 තත්ත්වාගණනය කළ මතය**
---------------------------------

තේ පර්යේෂණ මණ්ඩලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
-----------------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**
----------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් මගින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහ ගණනය කිරීමේදී මුදලින් ලද පොලී ආදායම රු. 782,970 ක් අඩුවෙන් ගැලපුම් කර තිබුණි. තවද සමාලෝචිත වර්ෂයේ ශුද්ධ ලාභය / අලාභය ගණනය කිරීමේදී සැලකිල්ලට නොගත් මුදල් ගලා යාමකට හෝ ගලා ඒමකට හේතු නොවූ ස්ථාවර වත්කම් අඩුවීම් හි වටිනාකම වන රු. 1,594,200 ක්, හා ප්‍රවර්තන වර්ෂයේ වත්කම් ප්‍රත්‍යාගණන ගැලපුම් වටිනාකම රු. 4, 632,556 ක් ද ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 02 හි 30 ඡේදයට පටහැනිව මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ගලපා තිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙළ කිරීමේදී, 2020 කාලච්ඡේදයට අදාළ පොලී ආදායම වූ රු. 6,746,688 ක මුදල මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ පොලී ලැබීම් යටතේ පෙන්වා ඇති අතර කාලච්ඡේදයට අදාළ නොවූ පොලී ලැබීම් වන රු. 782,970 ක ප්‍රමාණයක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාරක ප්‍රාග්ධන වෙනස් වීම් යටතේ උපචිත පොලී ලැබීම් ලෙස ගැළපීම් සිදු කර ඇත.<br><br>2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී, මුදලින් ලද පොලී ප්‍රමාණය සහ කාලච්ඡේදයට අදාළ පොලී ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශන තුළින් නිවැරදිව ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 02 අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතුය. |
| (ආ) සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද ප්‍රත්‍යාගණන වටිනාකම රු. 6,815,000 ක් වූ ශාන්ත ජෝකිම් වතුයායට අයත් වාහන 05 ක් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් | සම්පූර්ණයෙන් ක්ෂය වී ඇති තවදුරටත් ප්‍රයෝජනයට ගන්නා වාහන පිළිබඳව ගිණුම් සටහන් තුළින් හෙළිදරව් කිරීමටත්, ඉදිරියේදී නැවත ප්‍රත්‍යාගණය කර මූල්‍ය ප්‍රකාශනවලින් ඉදිරිපත් | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව |

| | | |
|---|---|---|
| පැවතියද රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 හි 92 (ආ) ඡේදය ප්‍රකාරව ඒ පිළිබඳව අනාවරණය කිරීමට කටයුතු කර නොතිබුණු අතර මෙම වත්කම් පිළිබඳ වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිති අංක 03 ප්‍රකාරව සංශෝධනය කර නැවත මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි. | කිරීමට කටයුතු කරනු ලැබේ. | වත්කම්වල ඵලදායි ජීව කාලය නැවත තක්සේරු කර ගිණුම් ගත කළ යුතුය. |
| (ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 18 හි 16 ඡේදය ප්‍රකාරව ජෛව විද්‍යාත්මක වත්කම්වල වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කළ යුතු වුවද, තලවකැලේ , රත්නපුර, හන්තාන, පස්සර සහ කොට්ටව යන ප්‍රාදේශීය කාර්යාලවල පැවති වටිනා ගස් 5,654 ක් එසේ තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි . | දැවමය වටිනාකමක් ඇති ශාකවල වානිජමය අගය තක්සේරු කිරීම සඳහා අදාළ ආයතන සමඟ සාකච්ඡා කර අවශ්‍ය කටයුතු සිදු කිරීමෙන් පසු ගිණුම් ගත කිරීමට කටයුතු කරනු ලැබේ. | ජෛව විද්‍යාත්මක වත්කම්වල වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මණ්ඩලය විසින් 1982 වර්ෂයේදී තේ සැකසුම් කිරීම සඳහා රු. 4,142,173 ක් වැය කර ආනයනය කරන ලද යන්ත්‍ර අදාළ ව්‍යාපෘතිය සඳහා යෝග්‍ය නොවූ බැවින් භාවිතයට ගෙන නොතිබුණු අතර මෙම යන්ත්‍රවල වටිනාකම භාණ්ඩාගාර අනුමැතිය මත පොත්වලින් ලියාහරින ලෙස 2014 වර්ෂයේදී පොදු ව්‍යාපාර පිළිබඳ පාර්ලිමේන්තු කාරක සභාව මඟින් නියෝග කර තිබුණද එසේ ලියාහැරීමකින් තොරව මෙම යන්ත්‍රවල වටිනාකම කෙරීගෙනයන වැඩ යටතේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. මෙම නිසා සමාලෝචිත වර්ෂය අවසානයට තිබුණු කෙරීගෙනයන වැඩවල වටිනාකම ඉහත ප්‍රමාණයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | 2021.03.25 දින පැවති අමාත්‍යාංශ සහ 2021.07.07 දින පැවති තේ පර්යේෂණ ආයතන විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී ලබා දුන් නිර්දේශ අනුව, මෙම ව්‍යාපෘතිය මඟින් සිදු කිරීමට අපේක්ෂා කළ දෑ, මිලදී ගත් යන්ත්‍ර පිළිබඳව හා මෙම පර්යේෂණ සංවර්ධන වියදම සිදු කළ කාල වකවානු සඳහන් කොට එම වියදම් විස්තර නොමැති බව සඳහන් කරමින් වැවිලි අමාත්‍යාංශය හරහා මහා භාණ්ඩාගාරයෙන් මෙම වියදම් කපා හැරීමට අනුමැතිය ඉල්ලා ලිපියක් 2021.08.05 දින යොමු කිරීමට කටයුතු කර ඇත. මේ පිළිබඳව පසු විපරම් කර අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ. | පොදු ව්‍යාපාර පිළිබඳ පාර්ලිමේන්තු කාරක සභාවේ නියෝගය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) ශ්‍රී ලංකා තේ මණ්ඩලයට අයත් වාහන 08 ක් රු. 8,913,550 කට ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද එම වාහනවල අයිතිය තේ පර්යේෂණ මණ්ඩලය වෙත පවරාගෙන නොතිබුණි. එසේම මේ පිළිබඳව සටහන් මගින් හෝ මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. | ශ්‍රී ලංකා තේ මණ්ඩලයට අයත් වාහන 09න් වාහන දෙකක් මේ වන විටත් අයිතිය පවරාගෙන ඇත. තවත් වාහන 04ක අයිතිය පවරා ගැනීම සඳහා CMT 52 පෝරම මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට භාර දී ඇත. ඉතිරි වාහන තුන අලුත්වැඩියාව සඳහා යොමු කර ඇති අතර වායු විමෝචන වාර්තා ලබා ගැනීමෙන් පසු අයිතිය පවරාගැනීමට කටයුතු කරනු ලැබේ.<br>ඉදිරියේදී අයිතිය පවරාගෙන නොමැති වාහන පිළිබඳ ව ගිණුම් සටහන් තුළින් හෙළිදරව් කිරීමට කටයුතු කරනු ලැබේ. | කඩිනමින් වාහනවල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) සමාලෝචිත වර්ෂයේ රු. 6,749,688 ක්වූ පොලී ආදායම මත ගෙවියයුතු රු. 1,619,925 ක ආදායම් බදු මුදල ගිණුම්ගත කර නොතිබුණු අතර ශාන්ත කූම්බ්ස් වතුයායේ සමාලෝචිත වර්ෂය අවසානයේදී නොවිකිණී ඉතිරිව තිබුණු කසල තේ කිලෝ ග්‍රෑම් 8,504 ක වටිනාකම අගය කර ගිණුම්ගතකර නොතිබුණි. එසේම 2019 වර්ෂයේදී නිම කරන ලද ඉහත වතුයායට අයත් "Save the Children Project" ව්‍යාපෘතියේ ඉදිකිරීම් වටිනාකම වූ රු. 1,583,508 ක මුදල ප්‍රාග්ධනිත කිරීම වෙනුවට නොනිම් වැඩ යටතේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ලද පොලී ආදායම මත ආදායම් බදු ගෙවීමට අවශ්‍යද යන්න පිළිබඳ කරුණු විමසා ආයතනය විසින් යවන ලද ලිපියට ලැබෙන පිළිතුර මත අවශ්‍ය ඉදිරි කටයුතු කරනු ලැබේ . මීට පෙර කසල තේ තොග මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කර නොතිබූ අතර 2021 වර්ෂයේ ගිණුම් පිළියෙළ කිරීමේදී කසල තේ තොග ගිණුම් සටහන් තුළින් හෙළිදරව් කිරීමට කටයුතු කරනු ලැබේ. Save the Children ව්‍යාපෘතියට අදාළ නොනිම් වැඩ ගිණුමේ ශේෂය 2021 වර්ෂයේ ගිණුම් පිළියෙළ කිරීමේදී ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කරනු ලැබේ. | වත්කම් සහ වගකීම් නිශ්චිතව හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවලට ගැනීම හෝ හෙළිදරව් කිරීම් කළ යුතුය. |
| (ඈ) මූල්‍ය ප්‍රකාශනවල අස්පෘශ්‍ය වත්කම් යටතේ දක්වා තිබුණු රු. 2,381,613 ක් ශාන්ත කූම්බ්ස් වතුයායට අයත් අයි.එස් ඕ. ප්‍රමිති සහතිකය සහ ඒ වෙනුවෙන් කරන ලද ගෙවීම්වලට අදාළ වවුචර් පත් හා උපයෝගී ලියවිලි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ශාන්ත කූම්බ්ස් වතුයායේ ISO සහතිකය 2014 වසරේදී කල් ඉකුත් වී ඇති අතර එතෙක් දරන ලද රු. 2,381,613 ක පිරිවැය, පෙර වර්ෂ ගැලපීමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල ලාභයට ගැලපීම් කර එම අස්පෘශ්‍ය වත්කම් වටිනාකම ගිණුම්වලින් ඉවත් කිරීමට 2021.03.25 දින පැවති වැවිලි අමාත්‍යාංශ විගණන හා කළමණාකරණ කමිටු රැස්වීමේ දී නිර්දේශ කරන ලදි.<br>මේ වන විට ISO සහතිකය ලබා ගැනීම වෙනුවෙන් දරන ලද වියදම්වලට අදාළ සනාථ කිරීමේ ලිපි ලේඛන මණ්ඩල පත්‍රිකාවක් මඟින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට සූදානම් කර ඇත. ඉන් පසු ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ. | I.S.O ප්‍රමිති සහතිකය හා එයට අදාළ උපයෝගී ලියවිලි විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඉ) මූල්‍ය ප්‍රකාශන අනුව තේ පර්යේෂණ මණ්ඩලයේ වාහනවල වටිනාකම රු. 72,132,125 ක් වූ අතර ගිණුම් සමඟ ඉදිරිපත් කරන ලද උපලේඛන අනුව ඒවායේ වටිනාකම රු. 71,760,591 ක් වූ බැවින් රු. 371,534 නොසැසඳුනු වෙනසක් නිරීක්ෂණය විය. | 2015.01.01 දිනට අදාළ ප්‍රත්‍යාගණන වටිනාකම් 2018.12.31 දිනට ගැළපීමට සිදු වීම නිසා වාහන ලෙජර් ගිණුමේ රු. 371,543ක් ඉවත් නොවී පැවතීම හේතුවෙන්, තේ පර්යේෂණ ආයතනයේ තලවාකැලේ වාහන උප ලේඛනයේ ශේෂය හා ලෙජර් ගිණුමේ ශේෂය අතර රු. 371,543 ක වෙනසක් ඇත. මෙය 2021 වර්ෂයේ ගිණුම් තුළින් නිවැරදි කරනු ලැබේ. | වෙනසට හේතු සොයා නිවැරදි කළ යුතුයි. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2017 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා තේ පර්යේෂණ ආයතනයට වතු වලින් ලැබිය යුතු විශ්ලේෂණ ආදායම (Analytical Charges) රු. 1,033,905 ක් අය කර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | 2017, 2018, 2019 හා 2020 වර්ෂවල විශ්ලේෂණ කටයුතු සඳහා ලැබිය යුතු ආදායම් සම්බන්ධයෙන් අදාළ සේවා ලබාගත් ආයතනවලින් ශේෂ තහවුරුවක් ලබාගෙන ඉදිරි ගිණුම් කටයුතු සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. | ලැබිය යුතු මුදල් ප්‍රමාදයකින් තොරව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) ශාන්ත කූම්බ්ස් වතුයායේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ වටිනාකම රු. 1,960,497 ක්වූ විවිධ ණයගැතියෝ තුළ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය, කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය හා ශ්‍රී ලංකා තේ මණ්ඩලය යන ආයතනයන්ගෙන් ලැබිය යුතු රු. 901, 846 ක එකතු වටිනාකමක් 2011 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එමින් පැවති අතර ඒවා සමාලෝචිත වර්ෂ අවසානය දක්වාම අයකරගෙන නොතිබුණි. | තොරතුරු කාර්යාලය තුළ නොමැති බවට දැනුම් දී ඇත. එම නිසා මෙම මුදල් අය කර ගැනීමට නොහැකි තත්ත්වයක් උදා වී ඇත. මේ පිළිබඳ තවදුරටත් පරීක්ෂා කර විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමට වාර්තා කරන ලෙස උපදෙස් ලබා දී ඇත. | ලැබිය යුතු මුදල් ප්‍රමාදයකින් තොරව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශාන්ත කුම්බිස් වතුයායේ ණයහිමි හා ගෙවිය යුතු ශේෂයෙහි 2010 වර්ෂයේ සිට සැපයුම්කරුවන්ට ගෙවිය යුතු රු. 1,820,148 ක්වූ ණය ශේෂයන් ඇතුළත්ව ඇති අතර ඒවා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | එම පැරණි ගෙවිය යුතු ණය ශේෂයන් ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ. | අදාළ පාර්ශව වෙත කඩිනමින් නිරවුල් කිරීමට හෝ හිමිකම් නොපාන්නේ නම් ඒ බව තහවුරු කරගෙන ආදායමට බැර කළ යුතුය. |

### 1.6.3 අත්තිකාරම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තේ පර්යේෂණ මණ්ඩලය විසින් 2017, 2019 සහ සමාලෝචිත වර්ෂයන්හිදී භාණ්ඩ සහ සේවා සැපයුම් වෙනුවෙන් අත්තිකාරම් ලෙස බාහිර ආයතනවලට ලබා දී ඇති රු. 1,504,723 ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම නිරවුල් කර නොතිබුණි. | 2017 හා 2019 වර්ෂයන්වලදී, ලබා දී ඇති නොපියවු අත්තිකාරම් මුදල් සම්බන්ධයෙන් නැවත සලකා බලා අවශ්‍ය කටයුතු 2021 වර්ෂයේදී ගිණුම් තුළින් නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ. 2020 වර්ෂයට අදාළ අත්තිකාරම් ගෙවීම් නිරවුල් කර 2021 වර්ෂයේ ගිණුම් තුළින් හෙළිදරව් කිරීමට කටයුතු කරනු ලැබේ. | කාර්යය අවසන් වූ වහාම අත්තිකාරම් මුදල් පියවීමට කටයුතු කළ යුතුය. |

### 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br><br>මු.රෙ.571(3) | වර්ෂ 02 ඉක්මවු රු. 831,705 ක් වු රඳවාගත් මුදල් සම්බන්ධයෙන් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | වර්ෂ 02 ඉක්ම වූ රඳවා ගත් මුදල් සම්බන්ධයෙන් ඉංජිනේරු අංශය නැවත දැනුවත් කිරීමට කටයුතු කරන අතර ඉංජිනේරු අංශයෙන් ලබා දෙන වැඩ තහවුරු සහතිකය මත රඳවා ගත් මුදල් නිදහස් කිරීමට හෝ ආදායමක් ලෙස | නිරවුල් කිරීමට හෝ හිමිකම් නොපාන බව තහවුරු වන්නේ නම් ආදායමට බැර කිරීමට පියවර |

| | | | |
|---|---|---|---|
| | | හඳුනා ගැනීමට 2021 ගිණුම් වර්ෂයේදී කටයුතු කරනු ලැබේ. | ගත යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 13.3 වගන්තිය | වැඩබැලීමේ පත්කිරීමක් කළ යුත්තේ නිත්‍ය පත්වීමක් කරන තෙක් තාවකාලික පදනමට වුවත් මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරී තනතුර, අංශ ප්‍රධානි තනතුරු 4 ක් ගබඩා පාලක තනතුරු 2 ක් වර්ෂ 2 සිට වර්ෂ 8 දක්වා කාලයක් වැඩබැලීමේ පදනම මත පත්කිරීම් සිදුකර සමාලෝචිත වර්ෂයේදී රු. 1,533,765 ක් ගෙවීම් කර තිබුණි. | මේ වන විට අයදුම්පත් කැඳවා ඇති අතර සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම සඳහා ඉදිරියේදි අනුමැතිය ලැබුණු පසු අවශ්‍ය කටයුතු සිදු කිරීමට නියමිතය. | වැඩබැලීමේ පත්කිරීම් වෙනුවට ස්ථිර පත්කිරීම් සිදු කළ යුතුය. |
| (ඇ) අංක පීඊඩී / 12 හා 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය හා 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වගන්තිය | මුදල් ආයෝජනයේදී මුදල් අමාත්‍යවරයාගේ හා අදාළ අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගත යුතු වුවත්, 2020 දෙසැම්බර් 31 දිනට මණ්ඩලය විසින් රු. 80,678,533 ක් කෙටිකාලීන තැන්පත්වල ආයෝජනය කිරීමේදී එපරිද්දෙන් අනුමැතියක් ලබාගෙන නොතිබුණි. | තේ පර්යේෂණ ආයතනයේ පාරිතෝෂික දීමනා සඳහා 2008 වර්ෂය තෙක් පවත්වාගෙන යන ලද අරමුදල් හා ශාන්ත ජෝකිම් වතුයායේ ආදායම්වලින් සැදුම්ලත් 2021 වර්ෂයට අදාළ රු. 80,678,534ක මුදල 2008 වර්ෂයේදී හා 2013 වර්ෂයේ අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලබාගෙන කෙටිකාලීන තැන්පත්වල ආයෝජනය කර ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව මුදල් ආයෝජනය කිරීමේදී මුදල් අමාත්‍යවරයා ගේ හා අදාළ අමාත්‍යවරයා ගේ අනුමැතිය ලබාගත යුතුය. |
| (ඈ) අංක පීඊඩී/12 හා 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ (i) 9.14 වගන්තිය | මානව සම්පත් කළමනාකරණය සඳහා නීති රීති සම්පාදනය කිරීමට අදාළ කාර්ය පරිපාටි අත්පොතක් සකස්කර භාණ්ඩාගාර ලේකම්ගේ | මේ සම්බන්ධයෙන් ගත යුතු ඉදිරි ක්‍රියාමාර්ග හෝ ඉහත සඳහන් කළ පොදු ආකෘතිය සම්බන්ධව හෝ උපදෙස් ලබා දෙන ලෙස රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත 2021.07.28 දිනැති ලිපියක් යොමු කර ඇත. රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් දුරකථනයෙන් සිදු කළ විමසීමකට | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අනුමැතිය ලබාගත යුතු වුවද සමාගම විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | අනුව, ඉදිරි සති දෙක තුළ අදාළ පොදු ආකෘතිය එළිදක්වන බවට දැනුම් දී ඇත. ඉන් පසු තේ පර්යේෂණ මණ්ඩලයෙන් අවශ්‍ය අනුමැතිය ලබාගෙන ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ. | |
| (II) 6.5.1 වගන්තිය | මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික වාර්තාවේ කෙටුම්පතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 2020 වාර්ෂික වාර්තාවේ කෙටුම්පතක් විගණකාධිපති වෙත යොමු කිරීමට කටයුතු කරනු ලැබේ. මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික වාර්තාවේ කෙටුම්පතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට 2021 වර්ෂයේ සිට කටයුතු කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික වාර්තාවේ කෙටුම්පතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. |

## 2 මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 48,058,726 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 151,170,276 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 103,111,550 ක ඌනතාවයේ අඩුවීමක් නිරීක්ෂණය විය. සාන්ත ජෝකිම් වතුයායේ හා සාන්ත කූම්බ්ස් වතුයායේ ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු. 32,816,911 ක ඌනතාවයේ අඩුවීමක් පැවතීමත්, පරිපාලන වියදම් රු. 92,575,248 කින් අඩුවීමත් මෙම තත්ත්වයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------

### 3.1 අනාර්ථික ගනුදෙනු

-----------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 නොවැම්බර් 24 දින රු. 14, 030, 854 ක් වැය කර ඉන්දියාවෙන් මිලදීගත් විශේෂ ව්‍යාපෘති සඳහා වූ උපකරණයක් (Walk in Type Environmental Controlled Facility) වසර තුනක් ගත වී තිබුණද එම උපකරණය ස්ථාපනය හා සවිකිරීම නිසි පරිදි සිදුකිරීමට නොහැකිවීම හේතුවෙන් ක්‍රියාකාරීත්වය අපේක්ෂිත මට්ටමට නොපැවතීම නිසා පර්යේෂණ සඳහා භාවිතා කළ නොහැකිව පැවතුණි. | මෙම උපකරණය මිළදී ගත් සමාගමට විරුද්ධව නීතිපති දෙපාර්තමේන්තුව හරහා නඩු පැවරීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකර ඇත.<br>මෙම ලිපිගොනුව භාරව කටයුතු කරනු ලබන රජයේ අධිනීතිඥ මෛත්‍රී අමරසිංහ මියගෙන් කරුණු විමසීමේදී දන්වා සිටියේ එම පැමිණිල්ල සකස් කර අවසන් බවත්, එය ආයතනයේ අධ්‍යක්ෂ වෙත යොමුකිරීමෙන් පසු හැකි ඉක්මනින් නුවරඑළිය රජයේ නීතිඥ මගින් නුවරඑළිය දිසාධිකරණයේ ගොනු කරන ලෙසත්ය. | නීතිමය ක්‍රියාමාර්ග කඩිනම් කර අලාභ අයකර ගත යුතුය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)මණ්ඩලයේ 2019 වර්ෂයේ රු. 13,453,726 ක් ලෙස තිබූ බැංකු අයිරා ශේෂය සමාලෝචිත වර්ෂයේදී රු. 30,611,962 ක් දක්වා වැඩිවී තිබුණු අතර ඒ වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලයට ගෙවීමට සිදුවී තිබුණු පොලී වියදම රු. 1,459,726 ක් විය. | තේ පර්යේෂණ ආයතන මුදල් පොත අනුව ලංකා බැංකු ආයතනික ශාඛාවේ රු. 16,352,742 ක බැංකු අයිරාවක් පෙන්නුම් කළද, ලංකා බැංකු ආයතනික ශාඛාවේ ජංගම ගිණුමට සම්බන්ධව අරමුදල් කළමනාකරණ ඉතුරුම් ගිණුමක් (Call Deposit ආකාරයේ) පවත්වා ගෙන යන බැවින් ජංගම ගිණුම වෙත ඉදිරිපත් වන චෙක්පත් සඳහා එම තැන්පතු ගිණුමෙන් මුදල් ලබාගෙන ගෙවීම් සිදු කරනු ලබයි. | ආයතනයට වාසිදායක වන ලෙස මූල්‍ය කළමනාකරණය කළ යුතුය. |
| (ආ) වලහන්දුව, දෙණියාය සහ කොට්ටව ප්‍රාදේශීය කාර්යාලවල 2010 වර්ෂයට පෙර රු. 72,031, 804 ක් වැය කර ගොඩනැගිලි ඉදිකර තිබුණද එම ඉඩම්වල අයිතිය මණ්ඩලය වෙත පවරාගැනීමට කටයුතු කර නොතිබුණි. | වලහන්දුව ඉඩම රාජ්‍ය වැවිලි සංස්ථාව සතු වන අතර තේ පර්යේෂණායතනය භුක්ති විඳින කොටසේ අයිතිය පවරා ගැනීම සඳහා වැවිලි අමාත්‍යාංශයේ අවධානයට යොමු කිරීමට කටයුතු කර ඇත.<br>දෙනියාය ඉඩම තලවකැලේ වතු සමාගම සතු වන අතර අයිතිය සඳහා ඉල්ලුම් කර ඇති අතර, මේ සම්බන්ධයෙන් අදාළ වතු සමාගම සමඟ ඉදිරියේදී සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වේ.<br>කොට්ටව ඉඩම වසර 30ක දීර්ඝ කාලීන බදු පදනම මත ලබාගැනීම සඳහා ගාල්ල යක්කලමුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ බදු නිලධාරීන්ගේ උපදෙස් මත තේ පර්යේෂණ මණ්ඩලයේ වත්මන් සභාපතිගේ අත්සනින් අවශ්‍ය දිවුරුම් ප්‍රකාශ එම කාර්යාලය වෙත යොමු කර ඇත. | අදාල ඉඩම්වල අයිතිය මණ්ඩලයට පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) සම්පූර්ණ වැටුප් සහිත විදේශ අධ්‍යාන නිවාඩු ලබා විදේශගතව නැවත සේවයට නොපැමිණි නිලධාරීන් 04 දෙනෙකු 2005 සහ 2009 වර්ෂවලදී මණ්ඩලය සමඟ එළඹ තිබූ ගිවිසුම් කඩකිරීම හේතුවෙන් අදාළ බැඳුම්කර වටිනාකම වූ රු. 15,054,891 ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ආපසු අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | බැඳුම්කර ගිවිසුම් උල්ලංඝනය කරමින් නැවත සේවයට නොපැමිණි නිලධාරීන් 04 දෙනාට විරුද්ධව නඩු පවරා ඇත. වර්තමානයේ දේශීය හා විදේශීය පුහුණුවීම් සඳහා අධ්‍යාන නිවාඩු ලබාගන්නා නිලධාරීන් අත්සන් කරනු ලබන බැඳුම්කර ගිවිසුම් විධිමත්ව හා ක්‍රමවත්ව සිදුකරනු ලබයි. | නෛතික කටයුතු ප්‍රමාද කිරීම හිතා මතා සිදුකර තිබේද යන්න පරීක්ෂාවකින් තහවුරු කරගෙන සුදුසු පියවර ගැනීම, නිලධාරීන් පිළිබඳ තොරතුරු සොයා ගැනීම සඳහා ගතහැකි විකල්ප ක්‍රම ක්‍රියාත්මක කිරීම. |

| | | |
|---|---|---|
| (ඇ) ශාන්ත කුම්බිස් වතුයායේ අභ්‍යන්තර පාලන දුර්වලතා නිසා 2017 වර්ෂයේදි සිදුව තිබුණු මූල්‍ය වංචාවක් නිසා අහිමි වූ මුදල රු. 10,300,169 ක් ණයගැති ශේෂය තුළ පවතින නමුත් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා පරීක්ෂණ කටයුතු අවසන් කර අලාභ අය කර ගැනීමට හෝ විනයානුකුල ක්‍රියාමාර්ග ගැනීමට අපොහොසත්ව තිබුණි. | ශාන්ත කුම්බිස් වත්තේ තේ අලෙවිසැලෙහි තේ අලෙවියේදී සිදු වූ රු. 7,073,432 ක මුදල් අක්‍රමිකතාව සහ ශාන්ත කුම්බිස් වතු කාර්යාලයේ ජංගම බැංකු ගිණුම්වල සිදු කරනු ලැබූ රු. 5,207,571 ක මුදල් තැන්පතු සම්බන්ධ අක්‍රමිකතාව සම්බන්ධයෙන් ගෙන ඇති පියවර මෙයට අමුණා ඇත. පරිපාලන අංශය විසින් මෙම කටයුතු පිළිබඳ පසුවිපරම් කටයුතු සිදු කරනු ලැබේ. | මූල්‍ය වංචාව සම්බන්ධ විධිමත් පරීක්ෂණ සහ විනය පරීක්ෂණ ප්‍රමාදයකින් තොරව අවසන් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) තේ පර්යේෂණ මණ්ඩලයට අයත් වාහන 02 ක් සඳහා වාහන ලියාපදිංචි මුල් පිටපත් මණ්ඩලය සතුව නොමැති බව නිරීක්ෂණය වූ අතර හන්තාන උපකාර්යාලයේ අත් ට්‍රැක්ටරයක් (2 Wheel hand Tractor with Tailor ) ලියාපදිංචි කර නොතිබුණු බව 2020 වර්ෂයට අදාළව සිදු කර තිබූ භෞතික වත්කම් පරීක්ෂාවේදී හඳුනාගෙන තිබුණි. | වාහන ලියාපදිංචි සහතික මුල් පිටපත් පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.<br>• අංක 32-1806, හන්තාන උප මධ්‍යස්ථානයට අයත් මෙම අත් ට්‍රැක්ටරය වසර 25ට පමණ පෙර තේ පර්යේෂණ ආයතනයට ලැබී ඇත. මේ පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් දෙපාර්තමේන්තුවෙන් විමසා ලියාපදිංචි කිරීමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ. | මණ්ඩලයට අයත් වාහනවල ලියාපදිංචි සහතික මුල් පිටපත් ලබා ගැනීමට කඩිනමින් ක්‍රියා කළ යුතුය. |

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)ශාන්ත ජෝකිම් වතුයායේ 2015 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා ප්‍රාග්ධන වියදම් වශයෙන් නැවත වගාවට වියදම් කරන ලද මුදල පිළිවෙලින් රු. 9,242,229, රු. 1,822,004, රු. 1,325,706, රු. 655,369, රු. 21,000 ක් සහ රු. 283,187 ක් වශයෙන් අඩුවීමක් දක්නට ලැබෙන බැවින් නැවත වගාව සඳහා යොමුවීමේ අඩු ප්‍රවණතාවයක් නිරීක්ෂණය වන අතර මෙම තත්ත්වය සෘජුවම වගාවේ | ප්‍රාග්ධන ප්‍රතිපාදන නොමැති වීම හේතුවෙන් නැවත වගා කටයුතු වසර ගණනාවකින් සිදු කිරීමට නොහැකි වී ඇත. කර්මාන්තශාලාවේ යන්ත්‍රෝපකරණවල පැවති අඩුපාඩු නිවැරදි කරන තෙක් සහ කාරක ප්‍රාග්ධනය හිඟ වීම මත කර්මාන්තශාලාවේ අලාභය අවම කිරීම සඳහා අඩු ධාරිතාවයකින් ක්‍රියාත්මක කිරීමටත් වර්ණ විභේදක යන්ත්‍රය ස්ථාපිත කර ඒ තුළින් ලැබෙන මිල මත ධාරිතාවය වැඩි කිරීමටත් වතු පිළිබඳ උපදේශන කමිටුව නිර්දේශ කර ඇත. නිමි තේ වල ගුණාත්මකභාවය වැඩි කර | නැවත වගාවට සහ පාළු වගාවට අවශ්‍ය ප්‍රාග්ධන ප්‍රතිපාදන වැඩි කර ගැනීමට ක්‍රියා කළ යුතුය. |

ඵලදාව අඩුවීම කෙරෙහිද බලපා ඇති බව නිරීක්ෂණය කෙරේ. ඒ අනුව වාර්ෂිකව නිමි තේ කිලෝග්‍රෑම් 1,020,000 ක ධාරිතාවයකින් යුත් සමස්ත කර්මාන්තශාලාව පසුගිය වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේදී එම ධාරිතාවයෙන් සියයට 72 සිට සියයට 85 ක් දක්වා ඌන ධාරිතාවයකින් යුතුව ක්‍රියාත්මක වීමට මෙම තත්ත්වය හේතු වී ඇති බවද නිරීක්ෂණය විය.

ගැනීම සඳහා අවශ්‍ය වර්ණ විභේදක යන්ත්‍රය මේ වන විට මිලදී ගෙන ඇති අතර ඒ තුළින් වතුයායේ ආදායම වැඩි කර ගැනීමටත් කර්මාන්තශාලාව ප්‍රශස්ත ධාරිතාවයෙන් පවත්වාගෙන යාමටත් බලාපොරොත්තු වේ.
ශාන්ත ජෝකීම් වත්ත සංවර්ධනය කිරීම සඳහා මේ වන විට වැවිලි අමාත්‍යාංශයෙන් 2021 වර්ෂය සඳහා රු. මිලියන 50ක ප්‍රතිපාදන අනුමත කර ඇත.

(ආ)සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ ක්‍රියාකාරී සැලැස්මේ දැක්වෙන දැනට ක්‍රියාත්මක වන පර්යේෂණ ව්‍යාපෘති 103 ක් අතරින් ව්‍යාපෘති 34 ක් පමණක් සමාලෝචිත වර්ෂයේදී සම්පූර්ණ කර තිබූ අතර ඉතිරි ව්‍යාපෘති 69 හි ප්‍රගතිය සියයට 2 සිට 95 දක්වා පරාසයන් තුළ පවතින බව නිරීක්ෂණය විය. විගණනය වෙත ඉදිරිපත් කර තිබුණු තොරතුරුවලට අනුව 2013 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා ආරම්භ කර තිබුණු පර්යේෂණ ව්‍යාපෘති අතරින් තේ ක්ෂේත්‍රයේ නිපුණත්වය සහිත මානව සම්පත් හිඟතාවය නිසා 2019 වර්ෂය වන විට පර්යේෂණ ව්‍යාපෘති 10 ක් ද විවිධ හේතුන් මත
රු. 40,891,685 ක් වැය කළ පර්යේෂණ ව්‍යාපෘති 28 ක්ද කල් දමා හෝ අතහැර දමා තිබුණු බව නිරීක්ෂණය විය.

පර්යේෂණ ව්‍යාපෘති සියල්ල දීර්ඝ කාලීන පර්යේෂණ සණයට අයත්ය. එබැවින් ව්‍යාපෘතීන්ට අදාළ පර්යේෂණ ක්‍රියාකාරකම් වසර කිහිපයක් පුරා ක්‍රියාත්මක කෙරේ.
2013 - 2017 ආයතනික සැලැස්ම අනුව තේ කර්මාන්තයේ පාර්ශවකරුවන්ගේ දායකත්වයෙන් ඉදිරිපත් කළ පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති 38 කල් දැමීමට තේ පර්යෙෂණ ආයතනය ගත් තීරණ සමහරක් වූයේ
(i)විද්‍යාත්මක උපදේශක කමිටුවේ (Scientific Advisory Committee – SAC) සහ
(ii)පර්යේෂණ පිළිබඳ උපදේශක කමිටුවේ (Consultative Committee on Research - CCR) නිර්දේශ මත කාලීන අවශ්‍යතා සලකා බලා සිදු කිරීම. ආයතනයේ පාලනයෙන් තොරව පවතින සුදුසු මානව සම්පත් නොමැතිවීම හේතුවෙන් මෙම ව්‍යාපෘති කල් දැමීමට සිදු වී ඇත.
එසේ වුවද, එකී අවශ්‍යතා සපුරාලීමට,තේ පර්යේෂණ මණ්ඩලය සහ පර්යේෂණ පිළිබඳ උපදේශක කමිටුවේ උපදෙස් මත තෝරාගත් ව්‍යාපෘති සමහරක් බාහිර විශ්ව විද්‍යාල හා විදේශ ආයතන සමඟ 2020/21 වසර තුළ ආරම්භ කෙරිණි.

ක්‍රියාකාරී සැලැස්මේ දැක්වෙන දැනට ක්‍රියාත්මක වන පර්යේෂණ ව්‍යාපෘති සාර්ථකව අවසන් කර ඵලදායී ලෙස උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය.

| | | |
|---|---|---|
| (ඇ)තේ පර්යේෂණ ආයතනයේ දෙනියාය, හන්තාන, කොට්ටව හා පස්සර යන ප්‍රාදේශීය කාර්යාලවල පවත්වාගෙන යනු ලබන තේ තවාන්වල සමාලෝචිත වර්ෂයේ පැවති මුළු පැළ සංඛ්‍යාවෙන් එනම් 175,286 කින්, රු. 2,899,177 ක් වටිනා පැළ 111,608 ක් වර්ෂය අවසානයට නොවිකිණී ඉතිරිව පැවති බව නිරීක්ෂණය වූ අතර එය මුළු පැළ සංඛ්‍යාවෙන් සියයට 64 ක් විය. පැළයක් සඳහා දරන ලද වියදමද රු. 17.15 සිට රු. 29.54 ක් දක්වා විචල්‍ය වී තිබුණි. | තේ තවාන්වල තේ රිකිළි සිටුවීම සිදු කරනු ලබන්නේ තවාන් වර්ෂයට (Nursery Calendar) අනුව සහ කලාපය අනුව වසරේ විවිධ කාල සීමාව (පහතරට - ජූලි සිට සැප්තැම්බර්, ඌව - සැප්තැම්බර් සිට නොවැම්බර්) තුළය. සාමාන්‍යයෙන් ගුණාත්මක තේ පැළයක් ලබා ගැනීමට මාස 9ත් 12ත් අතර කාලයක් ගත වේ. එබැවින් සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේදීම තේ තවාන් තුළ සැලකිය යුතු තේ පැළ සංඛ්‍යාවක් සාමාන්‍යයෙන් පවතී. තව ද මව් ශාක ව්‍යාපෘති සහ පර්යේෂණ අවශ්‍යතා වෙනුවෙන් තේ පැළ රඳවා ගනු ලබයි. තේ පැල තවාන් සඳහා වැයවන තවාන් සහ පස් සකස් කිරීමේ වියදම්, කම්කරු ශ්‍රමය සඳහා වැය කිරීම් වෙනස් වන බැවින් එකම මධ්‍යස්ථානයේද වසරින් වසර ඒකක පිරිවැය විචලනය වේ. | තේ තවාන්වල පැළ විකිණීමේ වර්ධනයක් ඇති කර ගැනීම සඳහා උපායමාර්ගික පියවර හඳුන්වා දියයුතුය. |

**3.4 ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රසම්පාදන සැලැස්මට අනුව සමාලෝචිත වර්ෂය අවසානය දක්වා මුළුමනින්ම ඉටු නොවූ රු. 2,585,000 ක් වූ ප්‍රසම්පාදන කාර්යයන් 17 ක් පවතින බව නිරීක්ෂණය විය. | ප්‍රසම්පාදන වැඩසටහනෙහි කාර්යය සාධනය සංශෝධනය විය යුතුය. | ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ හැකි සැලසුම් සකස් කළ යුතුය. |

**3.5 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)මණ්ඩලයේ අනුමත කාර්යය මණ්ඩලය තුළ ජ්‍යෙෂ්ඨ කළමණාකරණ තනතුරු 36 ක් පැවතියද සමාලෝචිත වර්ෂයේදී ඉන් තනතුරු 26 ක් පුරප්පාඩුව පැවතුණි. එමෙන්ම ජ්‍යෙෂ්ඨ අධ්‍යයන හා පර්යේෂණ තනතුරුවල පුරප්පාඩු 13 ක් සහ තාක්ෂණ හා තාක්ෂණික නොවන කළමණාකරණ සහකාර තනතුරුවලින් සියයට 60 ක් | ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තනතුරු 36න් තනතුරු 26ක් අනුමත බඳවා ගැනීමේ පරිපාටිය අනුව අභ්‍යන්තර උසස්වීමක් වන බැවින් සුදුසුකම් සපුරන ලද අභ්‍යන්තර අයදුම්කරුවන් නොමැතිකම නිසා එම පුරප්පාඩු පිරවීමට නොහැකි වී ඇත. නියෝජ්‍ය අධ්‍යක්ෂ (ව්‍යාප්ති), නියෝජ්‍ය අධ්‍යක්ෂ පර්යේෂණ (පිරිසැකසුම් හා තාක්ෂණ) තනතුරු පිරවීමට මණ්ඩල අනුමැතිය සඳහා යොමු කොට ඇත. අතිරේක අධ්‍යක්ෂ තනතුර සඳහා පත්වීම් ලිපිය නිකුත් කර ඇත. එමෙන්ම | පුරප්පාඩුව පවතින අනුමත කාර්යය මණ්ඩලයේ අත්‍යවශ්‍ය තනතුරු කඩිනමින් බඳවාගැනීමට කටයුතු කළ යුතුය. 2014 වර්ෂයේ පත්වීම් ලබාදුන් සේවකයන් කාර්යය මණ්ඩලයට ඇතුළත් කරගැනීමට කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ |

| | | |
|---|---|---|
| පුරප්පාඩුව පැවතුණි. තවද 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පරිදි තාවකාලික හෝ අනියම් පදනම මත බඳවාගෙන තිබූ දින 180 ඉක්මවූ සේවකයින් 98 ක් 2014 ඔක්තෝබර් 24 දින සිට ක්‍රියාත්මක වන පරිදි ස්ථිර පත්වීම් ලබාදී තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම මණ්ඩලයේ කාර්යය මණ්ඩලයට ඇතුළත් කිරීමට කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | පර්යේෂණ හා ව්‍යාප්ති නිලධාරී තනතුරු බඳවා ගැනීමට අදාළව පුවත්පත් දැන්වීම් පල කර අයදුම්පත් කැඳවා ඇත. 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව ලබා දී ඇති ස්ථිර පත්වීම් නීත්‍යානුකූල කිරීම සඳහා අනුමැතියට යොමු කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ වලට මෙතෙක් අනුමැතිය ලැබී නොමැත. මේ වන විට මිය යෑම, සේවයෙන් විශ්‍රාම යෑම වැනි හේතු මත PL 1 කාණ්ඩයේ පුරප්පාඩු 29ක් ඇති අතර ඒවා පුරප්පාඩු ලේඛණයට ඇතුලත් කර ගැනීමට අවශ්‍ය අනුමැතිය වැවිලි අමාත්‍යාංශය මගින් කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව වෙතින් ඉල්ලීම් කර ඇත. | අනුමැතිය ලබාගත යුතුය. |
| (ආ)අනුමත කාර්ය මණ්ඩලය තුළ කාර්යභාර නිලධාරී (OIC) තනතුරු නොමැති වුවද එම තනතුරුවල වැඩ බැලීම සඳහා නිලධාරීන් 07 දෙනෙකු පත්කර වැඩ බැලීමේ දීමනා ලෙස සමාලෝචිත වර්ෂය තුළදී රු. 360,000 ක් වැයකර තිබුණු අතර මේ සඳහා 2010 වර්ෂයේ සිට මේ දක්වා වැයකර ඇති මුළු මුදල රු. 3,713,802 ක් විය. | ස්ථානභාර නිලධාරි (OIC) තනතුර ස්ථිර තනතුරක් නොවන අතර, තේ පර්යේෂණ ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය තුල නොමැත. එසේ වුව ද ප්‍රාදේශීය මධ්‍යස්ථාන 06ක පරිපාලන හා මුදල්මය කටයුතු ක්‍රමවත්ව කරගෙන යෑම සඳහා එම මධ්‍යස්ථානවලට අනුයුක්තව සේවය කරන ජ්‍යෙෂ්ඨ පර්යේෂණ හෝ උපදෙස් නිලධාරින් ලවා එම කටයුතු ඉටු කර ගන්නා අතර අදාළ මධ්‍යස්ථානයේ පැය 24 පුරා රාජකාරි ඉටුකිරීමේ වගකීමට බැඳී සිටින බැවින් ඒ සඳහා රු. 5,000 ක මාසික දීමනාවක් තේ පර්යේෂණ මණ්ඩලයේ අනුමැතිය ඇතිව ගෙවනු ලබයි. | අනුමත නොවූ කිසිදු තනතුරක් සඳහා පත්වීම් ලබා නොදිය යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

------------------------------------------------

### 4.1 වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීම

------------------------------------------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 වර්ෂයේ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | 2019 වාර්ෂික වාර්තාව මුද්‍රණය සඳහා 2021.07.28 වැනි දින වැවිලි අමාත්‍යාංශයේ අනුමැතිය ලැබී ඇත. එහි පසුබිම් වාර්තාව වැවිලි අමාත්‍යාංශයට යොමු කර ඇත. එම වාර්තාවේ මුද්‍රණ කටයුතු සිදු කිරීම සඳහා මුද්‍රණාලයට අදාළ පිටපත බාර දී ඇත. 2019 වාර්ෂික වාර්තාවේ ඉංග්‍රීසි පිටපතේ පළමු කෙටුම්පත දැනට මුද්‍රණාලයෙන් අප වෙත ලැබී ඇති අතර 2019 සිංහල සහ දමිළ පිටපතේ පිටු සැකසීමේ කටයුතු සිදු කරමින් පවතී. | අංක පීඊඩී/12 හා 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාර වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතුය. |

## 4.2 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වියදම් විෂයයන් 17 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය වූ රු. 116,668,160 ක් ඉක්මවා රු. 123,016,573 ක් එනම් සියයට 105 ක් වැඩියෙන් වියදම් දැරූ අවස්ථා නිරීක්ෂණය වූ අතර, වියදම් විෂයයන් 16 ක මුළු ප්‍රතිපාදනය වූ රු. 35,997,000 න් සියයට 50 ට වඩා අඩුවෙන් එනම් රු. 5,113,435 ක් පමණක් උපයෝජනය කළ අවස්ථා නිරීක්ෂණය විය. ප්‍රතිපාදන වෙන්කර නොතිබියදී වියදම් දරා තිබූ අවස්ථා මෙන්ම ප්‍රතිපාදනවලින් කිසිදු උපයෝජනයක් සිදුනොකර මුළු ප්‍රතිපාදනයම එනම් රු. 13,800,000 ක් ඉතිරි වූ අවස්ථා නිරීක්ෂණය විය. ඒ අනුව අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය. | ආයතනයේ අත්‍යාවශ්‍ය කටයුතු සිදු කිරීමට සිදු වූ හෙයින් ප්‍රතිපාදන ඉක්මවා වියදම් දැරීමට සිදු වී ඇත. තවද අනෙකුත් වර්ෂයන්හිදී වාර්ෂික අයවැය සකස් කළද 2020 වර්ෂයේ වැය ශීර්ෂ සකස් කරන ලද්දේ කාර්තු වශයෙනි. ඉන් පසු 2020 වසර අග මුළු වර්ෂය සඳහාම අයවැය සකස් කළ අතර එහිදී ප්‍රතිපාදන ඉක්මවා වියදම් ඉහළ අගයක් වාර්තා විය. තවද ප්‍රාග්ධන අයිතම වෙනුවෙන් වැය කිරීම් සිදු කර ඇත්තේ පෙර වර්ෂයේ අයවැය තුළින් සහ විශේෂ ව්‍යාපෘති තුළිනි.<br><br>කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් පැනවූ නිරෝධායන ඇඳිරි නීතිය, හුදකලා කිරීම් වැනි හේතූන් නිසා ප්‍රතිපාදන සියයට 50 ට වඩා ඉතිරි වූ අවස්ථා විය.<br>ප්‍රතිපාදන වෙන්කර නොතිබියදී 2019 වර්ෂයට අදාළ රක්ෂණ ගෙවීම් තුනක් 2020 වසරේදී ගෙවා ඇත.<br>සම්පූර්ණ ප්‍රතිපාදන ඉතිරි වීම් 2021 වර්ෂයට ගෙන යන ලදි. | අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදාගත යුතුය. |

**4.3 තිරසර සංවර්ධන අරමුණු**

-------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | -------------------------------------------- | ------------ |
| එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධනය පිළිබඳ " 2030 න්‍යාය පත්‍රය " අනුව තේ පර්යේෂණ මණ්ඩලය විසින් තම විෂයපථය යටතට ගැනෙන කාර්යයන් සඳහා තිරසාර ඉලක්ක සහ ඒවායේ ප්‍රගතිය මැනීමේ දර්ශක හා වාර්ෂික සංධිස්ථාන හඳුනාගෙන එම කාර්යයන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කළ යුතු වුවත්, එසේ කර නොතිබුණි. | 2020 වසරේ තේ පර්යේෂණ ආයතන ක්‍රියාකාරී සැලැස්මේ එක් එක් ව්‍යාපෘතීන් සඳහා තිරසාර සංවර්ධන ඉලක්ක (Sustainable Development Goals –SDG) අංක ඇතුළත් කර ඒ හා අනුකූලව ක්‍රියාකාරකම් සිදු කෙරිණි. තවද, 2021 වසර පටන් තේ පර්යේෂණ ආයතන ක්‍රියාකාරී සැලැස්මට තිරසාර සංවර්ධන ඉලක්ක (Sustainable Development Goals – SDG)) අංක වලට අමතරව සෞභාග්‍යයේ දැක්ම (Vistas of Prosperity – VP) හා වැවිලි අමාත්‍යාංශයේ උපායමාර්ගික සැලැස්මේ (Ministry of Plantation Strategic Plan –MP SP)(2021 - 2025) අදාළ අංක ඇතුළත් කර ඇත. | 2017 අංක 19 දරන තිරසර සංවර්ධන පනතට අනුකූලව ක්‍රියා කළ යුතුය. |